**ව්‍යාපාරවල පැවැත්මට හා වර්ධනයට මුදල් හා මූල්‍ය ආයතන දක්වන දායකත්වය**

**ගනුදෙනු පහසුකර ගැනීම සඳහා මුදල් භාවිතයේ වැදගත්කම තහවුරු කරයි.**

## මුදල් යනු

භාණ්ඩ හා සේවා හුවමාරුවේ දී පොදුවේ පිළිගනු ලබන ඕනෑ ම දෙයක් මුදල් වශයෙන් සලකයි.

හුවමාරුව සඳහා මුදලේ අවශ්‍යතාව

- අතීතයේ මුදල් නොමැති ව සිදු වූ සෘජු හුවමාරුව භාණ්ඩ හුවමාරුව නම් විය.
- භාණ්ඩ හුවමාරුවේ දී විවිධ දුෂ්කරතා පැවතිණි.
- එබැවින් භාණ්ඩ හුවමාරුව වෙනුවට සැම දෙනා ම පිළිගන්නා පොදු මාධ්‍යයක අවශ්‍යතාව දැණුනි.
- එම හුවමාරු මාධ්‍ය මුදල් ලෙස හැඳින්විය.
- ඒ අනුව හුවමාරුව සඳහා මුදල් අවශ්‍ය බව පැහැදිලි වේ.

භාණ්ඩ හුවමාරුවේ දැකිය හැකි දුර්වලතා නම් කරන්න

...................................................................................................................
...................................................................................................................
...................................................................................................................
...................................................................................................................
...................................................................................................................
...................................................................................................................
...................................................................................................................
...................................................................................................................

## මුදලේ කාර්යයන්

- විනිමය මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම (A medium of exchange)
- වටිනාකම මැනීමේ මිනුම් දණ්ඩක් ලෙස කටයුතු කිරීම (standard of value)
- වටිනාකමේ සන්නිධියක් ලෙස කටයුතු කිරීම (store of value)
- විලම්බිත ගෙවුම් මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම (Defferred payments)

### විනිමය මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම

භාණ්ඩ හා සේවා හුවමාරුවේ දී අතරමැදියෙකු වශයෙන් කටයුතු කිරීමයි. නැතහොත් භාණ්ඩ හා සේවාවල මිල ගෙවනුයේ මුදල් මගිනි.

නිදසුන් : රු. 30,000 ක ජංගම දුරකථනයක් මිල දී ගැනීම

### වටිනාකම මැනීමේ මිනුම් දණ්ඩක් ලෙස කටයුතු කිරීම

භාණ්ඩ හා සේවාවන්හි වටිනාකම හෙවත් අගය මැනීම සඳහා මුදල් භාවිත කිරීමයි. මෙය මිල ( price) නම් වේ. මෙ මගින් ගිණුම් තැබීම පහසු වී ඇති නිසා මෙය ගිණුම් ඒකකයක් ( unit of Account) ලෙස ද හඳුන්වයි.

නිදසුන් : සපත්තු ජෝඩුවක් රු. 1999.90 ක් ලෙස මිල කිරීම

### වටිනාකමේ සන්නිධියක් ලෙස කටයුතු කිරීම

මුදල් රැස් කර තබා ගත හැකි ය. කාසි හා නෝට්ටු යල් පැනීමකින් තොර ව ක්ෂය වීමකින් තොර ව රැස් කර තබා ගනිමින් අනාගතයේ දි භාණ්ඩ හා සේවා මිලට ගැනීමට භාවිත කළ හැකි ය.

නිදසුන් : රු. 10,000 ක මුදලක් ඉතිරි කිරීම

**විලම්බිත ගෙවුම් මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම**
අනාගත මුදල් ගෙවීමක් සඳහා වර්තමානයේ ගිවිස ගත හැකි ය. එනම් ඉදිරි දිනයක දී මුදල් ගෙවීමේ කොන්දේසි යටතේ භාණ්ඩ හා සේවා මිල දී ගත හැකි විමයි.

නිදසුන් : 2016 ජනවාරි මස රු.5000 කට මිලට ගත් භාණ්ඩ තොගයක් සඳහා
2016 මාර්තු මස මුදල් ගෙවීමට ගිවිස ගැනීම.

**හොඳ මුදලක ලක්ෂණ**

- පොදු පිළිගැනීමක් තිබීම
- කල්පැවැත්මක් තිබීම
- අනුකරණයේ දුෂ්කරතාව
- පහසුවෙන් ගෙන යා හැකි වීම
- පහසුවෙන් හඳුනාගත හැකි වීම හෙවත් සමජාතීය බව
- කුඩා කොටස්වලට බෙදිය හැකි වීම
- පහත දැක්වෙන පරිදි මුදල් වර්ග කළ හැකි ය.

**ව්‍යවහාර මුදල්** ( currency)

මූල්‍ය අධිකාරියේ නියෝග මත නිකුත් කරන කාසි හා නෝට්ටු මෙලෙස හඳුන්වයි. ව්‍යවහාර මුදල් වලංගු මුදල් ලෙස ද හඳුන්වන අතර මේවායේ ද්‍රවශිලතාව 100% කි.
නිදසුන් : කාසි හා නෝට්ටු

**බැංකු මුදල්** (Bank Money)

වාණිජ බැංකු පවත්වා ගෙන යන ඉල්ලුම් තැන්පතු හෙවත් ජංගම ගිණුම්වල ශේෂ බැංකු මුදල් වේ. මෙම මුදල් ගෙවීම් කටයුතු කරන්නේ චෙක්පත් හරහා ය. ව්‍යවහාර මුදල් මෙන් ද්‍රවශීලතාව 100% ක් ම නැතත් ආසන්න මුදල්වලට වඩා ද්‍රවශීලතාවෙන් යුක්ත වේ.
නිදසුන් : වාණිජ බැංකුවල ඇති ජංගම ගිණුම් තැන්පතු

**ආසන්න මුදල්** (Near Money)

ව්‍යවහාර මුදු ල් මෙන් 100% ක් ද්‍රවශලී තාවෙන් යුකු ත් නොවූ එහෙත් වටිනාකමේ සනන් ධි යක කාර්ය ඉටු කරනු ලබන පහසුවෙන් මුදල් බවට පත් කළ හැකි වත්කම් ය.
නිදසුන් : වාණිජ බැංකුවල ඇති මහජනයා සතු කාලීන හා ඉතුරුම් තැන්පතු, භාණ්ඩාගාර
බිල්පත් , වාණිජ පත්‍රිකා

**විද්‍යුත් මුදල්** (E-money)
තොරතුරු හා ඩිජිටල් තාක්ෂණයේ ප්‍රතිඵලයක් ලෙස බිහි වී ඇති දේශීය මෙන් ම ජාත්‍යන්තර ගනුදෙනුවල දී ගෙවීම් කිරීමට යොදා ගනු ලබන මුදල් ය.

නිදසුන් :

හර කාඩ්පත් (debit card)
ගෙවනු ලබන මුදල් ප්‍රමාණය විද්‍යුත් ලෙස ගිණුමට හර වන, බැංකු ගිණුමේ මුදල් තිබෙන අයට පමණක් ලබා ගත හැකි කාඩ්පත් ය.

ණය කාඩ්පත් (credit card )
බැංකු ගිණුමක් නොමැති වුව ද ණය වශයෙන් භාණ්ඩ හා සේවා ලබා ගැනීම සඳහා මෙන් ම මුදල් ලබා ගැනීම සඳහා ද භාවිත කරන කාඩ්පත් විශේෂයකි.

පෙර ගෙවුම් කාඩ්පත් (prepaid card )
කලින් මුදල් ගෙවා ලබා ගත හැකි කාඩ්පත් ය.

මෙම කාඩ්පත් මගින් ගෙවීම් කිරීම පහසු කිරීම සඳහා පහත සේවාවන් (පහසුකම්) යොදා ගනී.

- ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර -(ATM යන්ත්‍ර - Automatic Teller Machines)
- ස්වයංක්‍රීය තැන්පතු යන්ත්‍ර ( ADM යන්ත්‍ර - Automatic Deposits Machines )
- චෙක්පත් තැන්පතු යන්ත්‍ර ( CDM යන්ත්‍ර - Cheques Deposits Machines )
- වෙළෙඳසැල් ගෙවීම් විද්‍යුත් පැවරුම් ජාල - ( Electronic funds transfer point of sales )
- ටෙලි බැංකු පහසුකම් - Tele banking
- අන්තර්ජාල බැංකු කටයුතු - Internet banking / Online banking
- ටෙලිවිෂන් බැංකු පහසුකම් - Televission banking